السنّة النبوية وعلومها
www.sunnah.global

කවරෙකු දිනකට සිය වාරයක්, لاَ إِلَهَ إِلَّا اللَّهُ، وَحْدَهُ لاَ شَرِيكَ لَهُ، لَهُ المُلْكُ وَلَهُ الحَمْدُ، وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ "ලා ඉලාහ ඉල්ලල්ලාහු, වහ්දහු ලා ෂරීක ලහු, ලහුල් මුල්කු වලහුල් හම්දු , වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: කවරෙකු දිනකට සිය වාරයක්, لاَ إِلَهَ إِلَّا اللَّهُ، وَحْدَهُ لاَ شَرِيكَ لَهُ، لَهُ المُلْكُ وَلَهُ الحَمْدُ، وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ "ලා ඉලාහ ඉල්ලල්ලාහු, වහ්දහු ලා ෂරීක ලහු, ලහුල් මුල්කු වලහුල් හම්දු, වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්" (තේරුම: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු නැත. ඔහු ඒකීයය ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. සර්ව රාජ්යය ඔහු සතුය. සියලු ප්රශංසා ද ඔහු සතුය. ඔහු සියලු දෑ කෙරෙහි බලය දරන්නාය.) යැයි පවසන්නේ ද, එය ඔහු වහලුන් දස දෙනෙකුට නිදහස දීම හා සමාන වන්නේ ය. එමෙන්ම කුසල් සියයක් ඔහු වෙනුවෙන් සටහන් කරනු ලැබේ. පාපකම් සියයක් ඔහුගෙන් ඉවත් කරනු ලැබේ. එදින හවස් වන තුරු ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව ඔහුට හිමි වනු ඇත. මීට වඩා අධික යමක් සිදු කරන්නෙකු මිස මීට වඩා උතුම් දෙයක් කිසිවෙකු ගෙන එන්නේ නැත."

[متفق عليه] [صحيح]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ: "කවරෙකු පහත සඳහන් පරිදි කියවන්නේ ද එනම්": "ලා ඉලාහ" නැමදුමට සුදුස්සු කිසිවෙකු නැත. "(ලාඉලාහ) ඉල්ලල්ලාහු, වහ්දහු ලා ෂරීක ලහු," අල්ලාහ් හැර. ඔහුගේ දේවත්වය ඔහුගේ පරිපාලනය, ඔහුගේ නාම හා ගුණාංගවල ඔහු ඒකීයය. එහි ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. "ලහුල් මුල්කු " සියලු කටයුතු සැළසුම් කරන්නේ හා ක්රියාත්මක කරන්නේ ඔහු ය. "වලහුල් හම්දු" ඔහු මැවූ හා සැළසුම් කළ සියලු කටයුතු සඳහා ප්රශංසාව හිමි විය යුත්තේ ඔහුට ය. "වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්" ඔහු සියලු දෑ කෙරෙහි බලය දරන්නාය. බාධා කරන හෝ වළක්වන කිසිවකු නැත. ඔහු නොසිතුවේ නම් කිසිවක් සිදු වන්නේ ද නැත. කවරෙකු මෙම දික්රය දිනකට සිය වාරයක් පවසන්නේ ද ඔහු වහලුන් දස දෙනෙකු නිදහස් කළ අයකු සතු කුසල් මෙන් අල්ලාහ් අබියස ලියනු ලැබේ. එමෙන්ම ස්වර්ගයේ කුසල් හා නිලයන් සියයක් ඔහු වෙනුවෙන් සටහන් කරනු ලැබේ. පාපකම් සියයක් ඔහුගෙන් ඉවත් කර ඒවාට සමාව දෙනු ලැබේ. එදින හිරු අවරට යාමෙන් හවස් වන තුරු ෂෙයිතාන්ගේ බලපෑම් හා ආධිපත්යයෙන් ආරක්ෂාව, රැකවරණය ඔහුට හිමි වනු ඇත. මීට වඩා අධික යමක් සිදු කරන්නෙකු මිස මීට වඩා උතුම් දෙයක් සමග මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිවකු ගෙන එන්නේ නැත.

https://sunnah.global/hadeeth/si/show/65905


النجاة الخيرية
ALNAJAT CHARITY


لجنة الدعوة الإلكترونية
EDC
E-Da'wah Committee